**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2021**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපිය යුතු රු.104,374,754 ක් කෙරීගෙන යන වැඩවල වැඩිවීම සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම රත්නපුර ගොඩනැගිල්ල සඳහා වන රු. 7,979,039 ක ප්‍රාග්ධනිත කර සටහන් 03 ජංගම නොවන වත්කම් යටතේ පෙන්වා ඇත. ශේෂය ගෙවිය යුතු ශේෂයට ගලපා පෙන්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.202,027,608 ක් වූ වත්කම්වල ඵලදායි ජීව කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | සියලුම මොටර් රථ ප්‍රත්‍යාගණනය අවසන්කල වහාම ගිණුම් පොත්වල ඇතුලත් කරනු ඇත. අනෙකුත් වත්කම් තක්සේරු කිරීම එක් එක් කාණ්ඩයකට අයත් වත්කම් වෙන වෙනම සිදු කල යුතුව ඇත. කළමණාකාරීත්වයේ තීරණය අනුව ඉදිරියේදී ගිණුම් වල ඇතුලත් කිරීමට පියවර ගනු ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 යේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට පැවති දේපල පිරියත හා උපකරණවල ධාරණ අගයෙන් හානිකරණය සඳහා ප්‍රතිපාදන ලෙස රු.3,907,223 ක් අඩුකර තිබුණි. | අධිකාරිය විසින් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගත් නාවුල ගොඩනැගිල්ල හා බෙලිදෙණිය ගොඩනැගිල්ල සඳහා 2012 වර්ෂයේ සිට හානිකරණ ප්‍රතිපාදන වෙන්කර ඇත. ඉන්පසුව 2021 වර්ෂයේ හානියට පත් රන්ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශය සතු උපකරණ 02 ක් සඳහා හානිකරණ ප්‍රතිපාදන වෙන්කර ඇත. | -එම- |
| (ඇ) | අධිකාරිය විසින් රාජ්‍ය බැංකුවක තැන්පත් කර තිබු රු.371,842,648 ක් වු ප්‍රදර්ශනාත්මක මැණික් ගල් 03 ක් 2020 වර්ෂය තුල රු.765,316,000 කට ප්‍රත්‍යාගණනය කර තිබු අතර එම ප්‍රත්‍යාගණන වටිනාකම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ප්‍රකාරව පොත්වල ගැලපීම් නොකර ගිණුම්වල සටහනක් ලෙස පමණක් දක්වා තිබුණි. | එහි වටිනාකම වන රු 765,316,000 ක අගය ඉදිරි වර්ෂයේ ගිණුම්වල පෙන්වීමට කටයුතු කරනු ඇත. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට නඩු 06 ක් වෙනුවෙන් ගෙවිය යුතු යැයි අපේක්ෂිත වන්දි මුදල් වටිනාකම රු.6,733,600 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 ප්‍රකාරව අසම්භාව්‍ය බැරකම් ලෙස මුල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් දක්වා නොතිබුණි. | ගිණුම් සිදුකරන දින වන විටත් ඒ සම්බන්ධයෙන් වන සත්‍ය බැරකමක් සිදුවී නොමැති බැවින් 2022 වර්ෂයේදී සමාලෝචනය කර ගිණුම්වල පෙන්වීමට කටයුතු කරනු ඇත. | -එම- |

**1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්තිය අනුව වත්කම්වලට අදාල හානිකරණ අලාභ හඳුනාගැනීමේදී එම වත්කම් සමාලෝචනය කර ඊට අදාලව වෙන් කල යුතු හානිකරණ අලාභ වටිනාකම වාර්ෂිකව ඇස්තමේන්තු කල යුතු වුවත් එසේ සිදු නොකර අනෙකුත් වත්කම්, ලැබිය යුතු දෑ හා තැන්පතු සහ අත්තිකාරම් සඳහා පිළිවෙලින් රු.200,000, රු.1,407,972 හා රු.1,433,947 ක් ලෙස වු එකම වටිනාකමක් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා හානිකරණ අලාභ ලෙස ගිණුම්වලට ගැළපීම් කර තිබුණි. | අධිකාරියේ ජංගම වත්කම්වලට අදාලව සිදුකර ඇති හානිපූර්ණ අලාභ වල ඇතුලත් රු 200,000 මුදල Gem & gem Institute වෙත ආයෝජනය කර ඇත. දැනට මෙම ආයතනය ක්‍රියාත්මක නොවන අතර ඊට අදාල තොරතුරු සොයාගත නොහැක. අනෙකුත් වත්කම් හා ලැබිය යුතු තැන්පතු සඳහා වන රු 1,407,972 හා 1,433,947 ට අදාල හානිකරණ අලාභ සමාලෝචනය කර ඉදිරියේදී ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු කරනු ඇත. | අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති වලට අනුව ක්‍රියාකල යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටා තිබූ ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ හුවමාරු මධ්‍යස්ථානය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ඇති කර ගෙන තිබූ බදු කුලී ගිවිසුම 2021 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කර තිබූ අතර ආරක්ෂිත ඇප තැන්පතු රු.16,368,300 ක් 2022 අප්‍රේල් 30 විගණිත දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | ආරක්ෂිත ඇප තැන්පතු රු.16,368,300 ක් නිදහස් කර ගැනීමට නම් සියළු සාප්පු නිරවුල් බුක්තියෙන් මෙම ආයතනය වෙත ලබා දිය යුතුව තිබුණි. එහෙත් සාප්පු අංක 30, 36 සහ 47 යන කඩාසාප්පු අදාළ සාප්පු හිමියන් විසින් අධිකාරිය වෙත 2021 ඔක්තෝබර් 31 වන දින වන විටත් භාර දී නොතිබුණු අතර අංක 33 හා 37 සාප්පු සඳහා සිහිකැඳවීම් ලබාදී ඇතත් හිඟ කුලී ගෙවා නොමැත. ඒ අනුව පෞද්ගලික සමාගමක් මැදිහත් වී කටයුතු කර ඇති අතර එම සමාගම වෙත පවතින තොග ගණනය භාරදී ඇත. නඩුවක් පවතින හෙයින් කිසිදු ආකාරයක අත්පත් කර ගැනීමක් සිදුකළ නොහැක. | ආරක්ෂිත ඇප තැන්පතුව කඩිනමින් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ගිණුම් අනුව අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය රු.3,577,395 ක් ලෙස දක්වා තිබුණද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂය ඇතුලත් කර නොතිබුණි. | ආයතනයෙන් අධිකාරිය වෙත මැණික් කැපීමේ පාඨමාලා වෙනුවෙන් ගෙවිය යුතු රු. 884,500 ක් සඳහා තහවුරු කරන ලද වියදම් ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලෙන් ගෙවා ඇත. අදාල පාඨමාලාව සම්බන්ධයෙන් අතිකරගත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව සිදුකල හැකි ගෙවීම පමණක් අධිකාරිය විසින් ගෙවීම් කර ඇත. | දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ගෙවිය යුතු රු.37,114,917 ක ශේෂයක් 2022 මැයි 31 දින වන විටත් නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත | | | |
| (i) 15(1) වගන්තිය | ශ්‍රී ලංකාව තුල මැණික් කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව වගකිව යුතු එකම බලධාරියා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වන නිසා මැණික් කර්මාන්ත විෂයට අදාළ ප්‍රධාන නියාමන අධිකාරිය තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලීම පනතේ 15(i) වගන්තියට පටහැනි බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුල එවැනි මැණික් ගැරීම් ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කර තිබුණි. | 2019 ජුනි 04 දින අංක E/17/19/NG&JA ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති නිර්දේශ ප්‍රකාරව අධිකාරිය සෘජුව මැණික් ගැරීමේ ව්‍යාපෘති වල නියැලී නොමැති අතර දෙවන පාර්ශවය වෙත මැණික් ගැරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇත. එහිදී අධිකාරිය විසින් දෙවන සහ තෙවන පාර්ශවයන් සමග ගිවිසුම් ගතවී ඇත්තේ අදාල ව්‍යාපෘතිය නිසිපරිදි අධීක්ෂණය කිරීම හා එම ව්‍යාපෘතිය තුලින් හමුවන මැණික් අධිකාරිය බාරයට ගැනීමටත් එම මැණික් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමින් රාජ්‍ය භාගය රඳවා ගෙන ඉතිරි මුදල සම්බන්ධිත බලපත්‍රලාභී පාර්ශවය වෙත නිදහස් කිරීම සම්බන්ධයෙන් වන බව පෙන්වා දෙමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| (ii) 15(2) වගන්තිය | මැණික් පරීක්ෂා කිරීම හා සහතික නිකුත් කිරීම සඳහා පවත්වාගෙන යන පෞද්ගලික රසායනාගාර ලියාපදිංචි කිරීමට හා නියාමනය කිරීමට ක්‍රමවේද සකස් කර නොතිබුණි. | රසායනාගාර ශ්‍රේණිගත කිරීම් පිළිබඳව සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කල අතර ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය ලබාදුන් උපදෙස් මත නැවතත් මණ්ඩලිය පත්‍රිකාවක් පිළියෙළ කර ඇති අතර, එය ඊලග අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | (iii) 17(1) වගන්තිය | කිසියම් තැනැත්තකු විසින් කිසිම ස්ථානයක ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යාමට අධිකාරිය වෙත ඒ කර්මාන්තය කරගෙන යන ස්ථානය ලියාපදිංචි කර ඇත්නම් මිස නොකල යුතු වුවද අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් නිසි නියාමනයක් සිදුකර නොතිබුණි. | 2021වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ස්වර්ණාභරණ ක්ෂේත්‍රය පිළිබඳව කටයුතු කිරීම සඳහා වෙනම අංශයක් ස්ථාපනය කිරීම සිදුකරනු ලැබූ අතර එම අංශය මගින් 2021 වර්ෂයේ කොරෝනා තත්ත්වයක් යටතේ වුවද බස්නාහිර පළාතේ සහ සෙසු සීමිත පළාත් කිහිපයක ස්වර්ණාභරණ වෙළඳසැල් සහ මැණික් වෙළඳසැල් කේන්ද්‍ර කරගෙන ලියාපදිංචි කටයුතු සහ බලපත්‍ර නිකුත් කිරීම මගින් (2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා) රු.1,534,104 ක් රැස්කර ගෙන තිබුණි. | වාර්ෂිකව ලියාපදිංචි කිරීම පිළිබඳව නියෝග සකස් කර නිසි නියාමනයක් සිදුකල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 486 | චෙක්පත් අගරු වූ විටකදී ඒ සඳහා වන වටිනාකම හැකි ඉක්මනින් මුදලින් අයකරවා ගත යුතු වුවත් වර්ෂ 09 ක් ඉක්මවූ අගරු වූ රු.178,840 ක චෙක්පත් 02 ක් සඳහා මුදල් අයකරගෙන නොතිබුණි. | වර්ෂ 09 ක් පැරණි රු 178,840 ක් සඳහා වූ අගරු වූ චෙක්පත් පිළිබඳ නීතිමය ක්‍රියා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොවීය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි. |
| | (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් 2022 පෙබරවාරි 22 දින වන විටත් සිදුකර නොතිබුණි. | පවතින ඉන්ධන අර්බුදය නිසා නාඋල, මොණරාගල හා මාතර කාර්යාලවල සමීක්ෂණ කටයුතු මෙතෙක් සිදුකිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී සම්පූර්ණ කිරීමට පියවර ගනු ඇත. | -එම- |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පමණක් සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන/සමෘද්ධි ප්‍රාදේශීය සංවිධාන වෙත පැවරිය හැකි නමුත්, මැණික් ව්‍යාපෘති සිදු කිරීමට එම සමිති වෙත බලය පවරා නොතිබුණි. නමුත්, අධිකාරිය විසින් මැණික් ව්‍යාපෘති 4 ක කටයුතු සිදුකිරීමට සමෘද්ධි | අදාළ වසම් දෙකෙහි අඩු ආදායම්ලාභීන් වන සියළු සමෘද්ධිලාභීන් නියෝජනය වන නිල සමිති වන්නේ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන යි. ඒ අනුව පෙර ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම්ලාභී ව්‍යාපෘතිවල පරිදිම මෙම ව්‍යාපෘතියේ දී ද අදාළ ප්‍රාදේශීය ලේකම්වරු වෙතින් තහවුරු කරගනු ලැබූ ගඟ දෙපස වසම් දෙකෙහි නිල සමෘද්ධි ප්‍රජාමූල | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| ප්‍රජා මුල සංවිධාන සමඟ ගිවිසුම්වලට එළඹ කටයුතු සිදුකිරීමට බලය පවරා තිබුණි. | සංවිධාන 07 මෙහි දී බලපත්‍ර එම පාර්ශවය ලෙස කටයුතු කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.204,372,389 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභය රු.25,577,610 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.178,794,779 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ව්‍යාපෘති ආදායම රු.123,475,200 කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ චීනයේ පැවති ජාත්‍යන්තර එක්ස්පෝ ප්‍රදර්ශනයේ වෙළඳ කුටි සකස් කර ගැනීම සඳහා රු.7,234,920 ක මුදලක් හා ප්‍රදර්ශනකරුවන් තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා රු.41,553 ක මුදලක් දරා තිබුණු අතර මෙම ප්‍රදර්ශනය නියෝජනය කිරීමට ශ්‍රී ලංකාවට නොහැකිවීම හේතුවෙන් දරන ලද සම්පූර්ණ වියදම වූ රු.7,276,473 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි | මෙම ප්‍රදර්ශනය සංවිධානය කිරීමේදී ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ අභිප්‍රාය වූයේ ශ්‍රී ලංකික ව්‍යාපාරිකයින්ට පහසුකම් සැළසීම තුළින් ශ්‍රී ලංකාවේ මැණික් සඳහා චීනයේ පවතින ඉල්ලුම තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සහ ඒ තුළින් රට තුළට ආගමනය විය හැකි විදේශ විනිමය වර්ධනය කිරීමයි. ඒ අනුව මෙම ප්‍රදර්ශනයේ අධිකාරිය, ලක්සල සහ චීනයේ පදිංචි ශ්‍රී ලාංකික මැණික් ව්‍යාපාරිකයින්ගේ මැදිහත් වීමෙන් ප්‍රදර්ශනය කිරීම හේතුවෙන් අධිකාරිය විසින් කරන ලද මූල්‍යමය දායකත්වය නිෂ්කාර්ය වියදමක් නොවන බවද අවධාරණය කරනු කැමැත්තෙමි. | නිසි සැලකිල්ලකින් හා අවධානයකින් යුතුව කාර්යක්ෂම හා ඵලදායි ලෙස වියදම් දැරිය යුතුය. |
| (ආ) | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවා ආයතනය රු.මිලියන 300.65 ක් වියදම් කර සිදුකරනු ලබන මැණික් නිධි ගවේෂණ ව්‍යාපෘති යටතේ බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුක්කන් ඔය ආශ්‍රිතව අධික මැණික් ලැබෙන ප්‍රදේශ හඳුනාගෙන ඒවා සිතියම් ගත කර අධිකාරිය දැනුවත් කිරීමටද පියවර ගෙන තිබුණි. මෙකී වාර්තා සිතියම් පරිශීලනය කිරීමකින් තොරව | මෙය හුදෙක් එම භූමියේ මැණික් පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ පතල් කැපීමක් නොවන අතර එය ජලාශ භූමියට හානි නොවන පරිදි මැණික් සම්පත ඉවත්කර ගැනීමට ඇති හැකියාව තහවුරු කර ගැනීම සඳහා සිදුකරනු ලබන පර්යේෂණ පතල් කැණීමක් බව කාරුණිකව දන්වමි.<br>අදාළ පරීක්ෂණ කැණීම් ක්‍රියාවලිය ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුකූලව මිල ගණන් කැඳවා ඉහත පරිදි සිදුකොට ඇත. ඒ අනුව තෝරාගත් | මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවීමේ අරමුණ අවබෝධ කරගෙන එම ආයතනයෙන් ඉටුකර ගත හැකි |

| | | | |
|---|---|---|---|
| | කුඹුක්කන් ඔය ජලාශයට යටවන භූමියේ මැණික් ඇත්දැයි පරික්ෂා කිරීමට පරීක්ෂණ පතල් කැණීම් ක්‍රියාවලියක් සිදුකිරීම සඳහා රු.5,754,000 ක ඇස්තමේන්තුවක් සකස් කර සමාගමක් වෙත පවරා සමාලෝචිත වර්ෂයේ රු.750,000 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. | ආයතනයට අදාල කාර්යය වෙනුවෙන් අත්තිකාරම් මුදලක් ගෙවා ඇත. | කාර්යයන් එම ආයතනයෙන්ම ඉටු කර ගත යුතුය. |
| (ඇ) | මැණික් වෙන්දේසි කිරීම මගින් ලැබුණු ආදායමෙන් රු.1,793,300 ක මුදලක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන 02 ක ඉල්ලීම මත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි නොවූ ව්‍යාජ සමිතියක් වෙත ගෙවා තිබූ අතර තවත් රු.12,507,556 ක් මුදලක් සමෘද්ධි සමිතිවල නමට චෙක්පත් යැවීම වෙනුවට සමෘද්ධි සමිතිවල නිලධාරීන් 04 දෙනෙකුගේ පෞද්ගලික බද්ධ ගිණුම් 02 ක් වෙත ප්‍රේෂණය කිරීමට අධිකාරිය පියවර ගෙන තිබුණි. | ගිවිසුම්ගත ප්‍රජාමූල සමිතිවල ලිඛිත ඉල්ලීම පරිදි ඔවුන් විසින් නම් කරන සමිති සාමාජිකයින්ගේ ඒකාබද්ධ ගිණුම්වලට අදාළ චෙක්පත නිකුත් කිරීම සිදුකර ඇති අතර කෙසේ වෙතත් අඩු ආදායම්ලාභී සමෘද්ධිලාභීන් වෙත අනිවාර්යයෙන්ම ගෙවීමට ගිවිසුම්ගතව ඇති ප්‍රතිලාභ කොටස 10% ඔවුන් වෙත ලැබෙන පරිදි අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත චෙක්පතක් මගින් නිකුත් කිරීම අනිවාර්යයෙන් සිදු කෙරේ.<br>සමෘද්ධි සමිතිවල නිලධාරීන් 04 දෙනෙකු නමින් පාර්ශවකරුවන් ලෙස ගිවිසුම්ගත සංවිධාන වල එකඟතාවය දිවුරුම් ප්‍රකාශ තුලින් ලබාගෙන සභාපතිතුමාගේ අනුමැතිය ඇතිව චෙක්පත් ලබාදී ඇත. සමෘද්ධි සංගම් සමග වන ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී අදාල ගිවිසුමේ චෙක්පත් නිකුත්කරන ලද නිලධාරීන්ද සාක්ෂිකරුවන් ලෙස අත්සන් තබා ඇති අතර සමෘද්ධි සංගම් දෙකෙහි නිලධාරී මණ්ඩලය විසින් බලය පැවරීමේ ලිපිද නිකුත් කර තිබුණි. | රජයේ මුදල් නිසි අධිකාරි බලයකින් තොරව පුද්ගලයන්ට පෞද්ගලික ගිණුම්වලට ප්‍රේෂණය නොකළ යුතුය. |
| (ඈ) | යාන්ත්‍රික පතල් කැණීම සඳහා බලපත්‍ර ලබාදී තිබූ ලිපිගොනු අංක CB 2600 A දරන බලපත්‍රලාභියාගෙන් 2020 මාර්තු 02 දිනැති අංක 2165/2 දරන ගාස්තු අයකරන ගැසට් නිවේදනය ප්‍රකාරව විවිධ කාර්යයන් සඳහා රු.1,635,000 ක සේවා ගාස්තුවක් අයකල යුතු වුවත් රු.48,000 ක සේවා ගාස්තුවක් පමණක් අයකර තිබුණි. | මෙම ලිපිගොනුවට අදාලව 2021/2022 වාර්ෂික යාන්ත්‍රික පතල් කැණීම් අවසරය දීර්ඝ කිරීම සඳහා බලපත්‍රධාරී විසින් 2021 සැප්තැම්බර් 22 දින ලිඛිත ඉල්ලීමක් සිදු කරන ලදී. එකී ඉල්ලීමට අනුව අධිකාරියේ දැනට ක්‍රියාත්මක ක්‍රමවේදයට අනුව දීර්ඝ කිරීමේ කටයුතු සිදු කරන ලදී. ගාස්තු ගෙවීමේදී බලපත්‍රධාරී අනිකුත් සියලු ගාස්තු ගෙවා ඇති නමුත් අතපසු වීමකින් වැඩි කරන ලද වර්ග අඩි 5000 සඳහා අය කල යුතු ඇප මුදල් අය කර ගැනීමට කළමනාකරණ සහකාර නොහැකි වී ඇත. එබැවින් එම අතපසු වූ මුදල් ගෙවන ලෙස මා විසින් ද බලපත්‍රධාරී දැනුවත් කර ලිපියක් යොමු කරන ලදී.<br>එම ගාස්තු ගෙවීමට තරම් ප්‍රමාණවත් මුදලක් ඔහු සතු නොමැති බැවින් දැනට ඇති වර්ග අඩි | ගැසට් නිවේදනය ප්‍රකාරව නිවැරදි සේවා ගාස්තු අයකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | 10000 පමණක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. එකී ඉල්ලීම පරිදි බලපත්‍රධාරී විසින් වර්ග අඩි 10000 ට වඩා කැනීම් කටයුතු සිදු කර ඇත්දැයි ක්‍රියාත්මක නිළධාරි විසින් නිරීක්ෂණය කරන ලදී.<br>එකී ක්රියාත්මක නිළධාරී නිර්දේශය අනුව 2021 නොවැම්බර් 12 දිනැතිව මා විසින් නිකුත් කරන ලද කැනීම් බලපත්‍ර අවලංගු කර, නව බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කරන ලදී.<br>වැඩි කර ගැනීමට නියමිතව තිබූ වර්ග අඩි 5000 සඳහා ගෙවිය යුතු විශේෂ ඇප මුදල වන රු.1000,000 , සමාන්‍ය ඇප මුදල - 250,000 , ඒ සඳහා ගෙවිය යුතු වාර්ෂික අධීක්ෂණ ගාස්තු වන රු.50,000 ක මුදල හැර යාන්ත්‍රික පතල් අවසරය වාර්ෂික දීර්ඝ කිරීමේ දී අය කර ගැනීමට නියමිත සියලු ගාස්තු අය කර ගත් බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඉ) | 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත 1993 වර්ෂයේ අනුමත කර ගැනීමෙන් පසුව එය කාලානුරූපීව සංශෝධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂයේද පියවර ගෙන නොතිබුණි. | පනතේ සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡා සැසි හතරක් මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගේ සංගම් සමඟ 2021 වර්ෂය තුල පවත්වන ලද අතර ඔවුන්ගේ යෝජනා සහ අදහස් සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යාංශ ලේකම්තුමා සමඟ ද අධිකාරියේ අභ්‍යන්තර නිළධාරීන් සමඟ ද සාකච්ඡා සැසි තුනක් සිදු කරන ලදී. ඒ අනුව අවසාන වශයෙන් ලබා ගත් යෝජනා සමඟ යෝජිත පනතේ සංශෝධන සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගේ සංගම්හි ඉල්ලීම මත එම සංගම් වෙත යොමු කිරීමට නියමිතය. | කාලානුරූපීව පනත සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැණික් හා ස්වර්ණාභරණ වෙළඳපල, සංචාරක කර්මාන්තයේ කේන්ද්‍රස්ථානය සහ ව්‍යාපාරික ප්‍රජාවගේ ඉල්ලීම මත 2016 වර්ෂයේ මැණික් ගල් පරීක්ෂා කිරීමට සහ රන් ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා ගාල්ල ප්‍රදේශයේ මැණික් රසායනාගාරයක් පිහිටුවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුල එම රසායනාගාරය දින 24 ක් පමණක් | 2021 වර්ෂය තුල ගාල්ල රසායනාගාරය දින 24ක් පමණක් විවෘතව තිබූ අතර එම කාලය තුල රු 175,600 ක අදායමක් ලබා තිබුණි. ඉතා සීඝ්‍රයෙන් පැතිරී ගිය covid 19 වසංගතය හේතුවෙන් වසංගත තත්වය සමනය වන තෙක් ගාල්ල රසායනාගාරයේ කටයුතු සතියේ එක් දිනක් පමණක් සිදුකිරීමට හා වරින්වර රට වසා තැබීම්, අන්තර් පලාත් ප්‍රවාහන පහසුකම් අත්හිටුවා තැබිමද අපගේ රත්න විද්‍යාඥයින් | අධිකාරියේ මෙහෙයුම් කාර්යක්ෂමතා ව හා ඵලදායිව ඉටු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විවෘතව තිබූ අතර එම කාලය තුල රු.175,600 ආදායමක් පමණක් ලබා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මාස 04 ක කාලයක් තුල සේවා කටයුතු සඳහා රත්න විද්‍යාඥයන් අනුයුක්ත නොකිරීම නිසා එම කාලය තුල කිසිඳු සේවාවන් සපයා නොතිබුණි. | කිහිප දෙනෙක් නිරෝධායනට ලක්වීමද ගාල්ල රසායනාගාරය දිර්ඝකාලීනව වසා තැබීමට හේතුවූ බව පෙන්වා දෙමි. | |
| (ආ) | මැණික් බලපත්‍ර නිකුත් කිරීමේදී භාරනු ලබන මැණික් පතල් නැවත පුරවා ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රු.4500, රු.9000 සහ යාන්ත්‍රික පතල් සඳහා වර්ග අඩි 3000-4000 ක් දක්වා ප්‍රමාණයක් සඳහා රු.600,000 සිට රු.5,000,000 ත් ලෙස විශේෂ ආරක්ෂණ ඇපයක් පතල්කරුවන්ගෙන් අයකර තිබුණි. මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය වීමක් සිදුවී තිබේද යන්න පිළිබඳව නිසි නියාමනයක් සිදුවී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල රු.8,980,350 ක මුදලක් පතල් කැණීම්කරුවන් විසින් නැවත ලබා ගෙන නොතිබූ අතර භූමි ප්‍රතිසංස්කරණය සඳහා අධිකාරිය රු.3,099,934 ක මුදලක් පමණක් දරා තිබුණි. | අධිකාරිය විසින් බලපත්‍ර ලබාදෙන මැණික් බලපත්‍ර කොන්දේසි වලට අනුව පතල් බලපත්‍රය අවසන්වී මාස 02 ක කාලය තුල අදාල පතල් වල වසා ඇප මුදල් ඉල්ලුම් කිරීම සිදුකරනු ලබන අතර එසේ නොවන විටදී අදාල ඇපමුදල් රාජසන්තක කිරීම කරනු ලබන බැවින් අධිකාරියේ අදායමට එකතුවේ.<br>ඇප මුදල් රාජසන්තක කරනු ලබන නොවැසූ පතල් වැසීම අධිකාරිය විසින් සිදුකරනු ලබයි. | මැණික් පතල් වලවල් වසා අදාල භූමි නිසි ලෙස ප්‍රතිසංස්කරණය වීමක් සිදුවී තිබේද යන්න පිළිබඳව නිසි නියාමනයක් සිදු කළ යුතුය. |
| (ඇ) | අධිකාරිය සතු මැණික් ගැරීමේ ව්‍යාපෘති පිළිබඳව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| | (i) වටවල මවුන්ජීන් මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබාගත යුතු අනුමැතිය ලබා නොගැනීම, ඉඩම් වෙන්දේසියෙන් සියයට 40 ක් ලබා ගැනීමේ පදනම මත මහවැලි අධිකාරිය මෙම ව්‍යාපෘතිය සඳහා එකඟතාවය ලබාදී තිබුණද වෙන්දේසි කිරීමකින් තොරව සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයක් සමඟ අධිකාරිය | මැණික් සම්පත් බහුලව පවතින ස්ථානවල මෙම අනවසර මැණික් ගැරීම් ගැටලුව ඇතිවන අතර මැණික් සාන්ද්‍රගතව ඇති ස්ථාන වෙනුවට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශය පරිදි කිලෝමීටරයක් දුරින් හෝ වෙනත් ස්ථානයක කැණීම් කිරීම නිශ්ඵල ක්‍රියාවකි.<br>මෙම ස්ථාන වල සිදුකර තිබූ අනවසර මැණික් ගැරීම් හේතුවෙන් එම ස්ථානයේ පිහිටි පාලමේ ස්ථාවර භාවයට පවා හානිවන තත්වයක් පැවතුණි. අනවසර මැණික් ගැරීම් සිදුකිරීම හේතුවෙන් ගංඉවුරු වලට හා පරිසරයට දැඩි ලෙස හානි සිදු වී තිබූ අතර එම හේතුව මත මධ්‍යම පරිසර අධිකාරිය විසින් ජාතික මැණික් | පනත ප්‍රකාරව අධිකාරියට තුන්වන පාර්ශවය සමඟ සෘජුවම මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල නියැලිය නොහැකි වුවද ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘති නිසි |

| | | | |
|---|---|---|---|
| | මැණික් ගැරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතිය ක්‍රමවත් ලෙස ආරම්භ නොකිරීම හේතුවෙන් රාජ්‍ය ආයතන කිහිපයක් ලාභ කොටස් ඉල්ලීම, වෙන්දේසි කිරීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියට එකවර ලබාගත හැකි විශාල ආදායමක් අහිමි වීම යන අඩුපාඩු නිරීක්ෂණය විය. එමෙන්ම, පාරිසරික හානි ඇති නොවන පරිදි කොන්දේසි ගණනාවකට යටත්ව කැණීම් කිරීමට මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලබාදී තිබුණු අතර ඔයෙහි වැලි කොට්ට යොදා එක් පැත්තකින් ජලය ගලා යාමට සලස්වා තිබීම, ඔයෙහි පතුල හාරා ඉල්ලම් පස් ගොඩ ගනිමින් පැවතීම ඉවුරු තුල විශාල පස් ගොඩවල් ගොඩ ගසා තිබීම හා මැණික් සේදීම් යන්ත්‍රය ඔය ආසන්නයේ සවි කර තිබීම භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | සහ ස්වර්ණාභරණ අධිකාරියේ අධීක්ෂණය යටතේ එම මැණික් සම්පත ඉවත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සිදු කර තිබුණි. | අනුමැතිය සහිතව අඩුපාඩු මහ හරවා ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ii) | කළු ගඟ හැරනියාවක මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා රු.125,000,000 ක වටිනාකමකට ව්‍යවසායකයෙකු සහ සමෘද්ධි සමිති 02 ක් තෝරාගෙන තිබු අතර මෙම ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම සඳහා පත්කල කමිටුව සති 02 කට වරක් ව්‍යාපෘති භූමියට පැමිණ පරීක්ෂා කර පිරික්සුම් ලේඛනයක් සම්පූර්ණ කර සහභාගී වු නිලධාරීන් අත්සන් කිරීමෙන් පසුව එය අධිකාරියට භාරදිය යුතු වුවත් එසේ භාරදී නොතිබු අතර ව්‍යාපෘතිය නිසි පරිදි අධීක්ෂණය වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ රාජකාරී කළ නිලධාරීන් සහ අනෙකුත් කණ්ඩායම් වරින් වර රෝගයට භාජනය වූ අතර එම වසංගත තත්වය හා අධික වර්ෂාව සහ ගං වතුර තත්වය හේතුවෙන් 2021 අවසන් අර්ධය තුල බොහෝ කාලයක් ව්‍යාපෘති කටයුතු අකර්මණ්‍ය විය.<br>ව්‍යාපෘතිය බොහෝ කාලයක් අකර්නම්‍යව පැවති අතර දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින ව්‍යාපෘතිය අධීක්ෂණය සඳහා විගණන උපදෙස් මත පිරික්සුම් ලැයිස්තුවක් සකස් කර අදාල කමිටු නිලධාරීන් කැඳවීමට කටයුතු යොදනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (iii) | නිධානය මැණික් ගැරීමේ ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සහ කිරිඇල්ල හා අයගම ප්‍රාදේශීය ලේකම් වෙතින් අනුමැතිය ඉල්ලා තිබුණද අනුමැතියන් ලැබී නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ව්‍යවසාය පාර්ශවයක් සම්බන්ධ කර ගැනීමට මිල ගණන් කැඳවා නොතිබීම නිසා ලබාගත යුතුව පැවති ඉහල ලංසු මුදලක් අහිමි වී තිබුණි. මෙම මැණික් ඉල්ලම් ගොඩගැනීම සඳහා සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන 07 ක් සමඟ ගිවිසුම් ගතව තිබු අතර මැණික් විකිණීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 60 ක් එම සමිති වෙත ලබාදීමට එකඟ වී මෙම සමිතිවල මුල්‍ය හැකියාව සොයා බැලීමකින් තොරව ව්‍යාපෘතියේ කටයුතු සඳහා සම්බන්ධ කරගෙන තිබුණි. | අනවසර මැණික් ගැරීම් පාලනය කිරීමට අපහසු ස්ථානවල සිදුවන අනවසර මැණික් ගැරීම් වළක්වා අධිකාරිය මැදිහත්ව කඩිනමින් අදාළ මැණික් ඉල්ලම් ඉවත් කර ගැනීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ඉල්ලුම් කලද එම අනුමැතිය ලබාදීම ප්‍රමාද විය. ඒ හේතුවෙන් මෙම ස්ථාන අනවසර ගැරීමට ලක්වී මැණික් ඉල්ලම් අන්සතු වීම වලක්වා ලීම සඳහා 2016 දෙසැම්බර් 07 දිනැති ජනාධිපති ලේකම් මාර්ගෝපදේශය පදනම් කරගෙන මෙම ව්‍යාපෘතිය ආරම්භ කොට ඇත. | -එම- |
| (iv) | කළු ගඟ හැරනියාවක හා නිධානය මැණික් ගැරීමේ ව්‍යාපෘතිවල පිළිවෙලින් ලබා ගත් ඉල්ලම් ගෝනි 1289 ක් හා 1975 ක් ගැරීමෙන් තොරව ව්‍යාපෘති භූමියේ රඳවාගෙන තිබුණි. | දෙසැම්බර් අග භාගයෙහි සහ 2022 ජනවාරි මස ගොඩ ගන්නා ලද ඉල්ලම් ගබඩා කොට ප්‍රමාණවත් ඉල්ලම් ප්‍රමාණයක් එකතු වූ පසු කඩිනමින් ගැරුම් කර ලැබුණු මැණික් ආරක්ෂිතව බැංකුවේ තැන්පත් කරන ලදි. අදාල මැණික් ඉල්ලම් තොග සේදිමේදී හමු වූ මැණික් 2022 පෙබරවාරි 24 වන දින රුපියල් 54,366,996.80 ක මැණික් වෙන්දේසි කිරීමද සිදු කොට ඇත. | -එම- |
| (ඇ) | මොණරාගල බඩල්කුඹුර ගැඩවිල මැණික් ගැරීමේ ව්‍යාපෘතිය පර්චස් 13.5 වූ ඔයක කොටසක මැණික් ගැරීම සඳහා රු.මිලියන 5 ක වටිනාකමකට ව්‍යවසායකයෙකු සහ තවත් සමෘද්ධි සමිති 2 ක් තෝරාගෙන තිබුණි. ව්‍යවසායක පාර්ශවය විසින් ඉන් පර්චස් 9.5 ක් වූ ඉඩම් ප්‍රදේශයක කැණීම් කර ඉතිරි පර්චස් 4 ක ප්‍රමාණයේ කැණීම් කිරීමට නැවත අවසර ඉල්ලා තිබුණි. නීතිපති | මැණික් ගැරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා තවදුරටත් ඉතිරිව පැවති කැණීම් නොකරන ලද කුඩා බිම් ප්‍රමාණයන් අතහැර දැමුවේ නම් ,නැවත අනවසර ක්‍රියා ව්‍යාප්තවීම වැළැක්විය නොහැකි තත්ත්වයක් ඇති වේ. වෙන්දේසියක් සඳහා සුදුසු පසුබිමක්ද නොතිබූ බැවින් රජයට ආදායමක් ලබා ගැනීම සඳහා ප්‍රායෝගික විසඳුමක් වශයෙන් අදාල ආසන්නතම ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන (ප්‍රාදේශීය ලේකම් වෙතින් තහවුරු කරගෙන) සමඟ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ව්‍යාපෘති ගිවිසුමට එළඹ අදාල | -එම- |

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් මැණික් ව්‍යාපෘති සිදු කිරීමට පනතේ ප්‍රතිපාදන සපයා නොමැති බව දැනුම් දීම මත අදාල ගිවිසුම් කාලය දීර්ඝ නොකර සමෘද්ධි සමිති 2 ක් නැවත සම්බන්ධ කර ගෙන එම ස්ථානයේ දෙවන අධියර යටතේ කැණීම් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත නව ගිවිසුමක් අධිකාරිය විසින් ඇති කරගෙන තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. | |

**3.3 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් ස්වර්ණාභරණ කර්මාන්තකරුවන්ගෙන් රු.5000 ක වාර්ෂික ලියාපදිංචි ගාස්තුවක් අයකර 2008 වර්ෂයේ ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල පිහිටුවා තිබු අතර කර්මාන්තයේ සංවර්ධනය වෙනුවෙන් අරමුදල භාවිත කිරීමට නිශ්චිත සැලැස්මක් හෝ ක්‍රමවේදයක් නොවූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.82,536,818 ක අරමුදල් නිශ්කාර්යව තබා තිබුණි. | ස්වර්ණාභරණ කර්මාන්තයේ නිරත පුද්ගලයන් සහ ව්‍යාපාරික ස්ථාන ලියාපදිංචි කිරීම මගින් රැස් කරගන්නා මුදල් විශේෂ අරමුදලක තිබෙන අතර එම මුදල් උපයෝගී කරගෙන ස්වර්ණාභරණ කර්මාන්තයේ නිරත ශිල්පීන්ගේ උන්නතිය උදෙසා පරිහරණය කිරීමට මාණ්ඩලික පත්‍රිකා අංක 2176 යටතේ අනුමත කරගෙන ඇති පරිදි අදාළ ශිල්පී උපකරණ හා මෙවලම් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර ඒ අරඹයා 2022 අප්‍රේල් 08 වන දින පුවත්පත් දැන්වීමක්ද පළ කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටු වන අයුරින් අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14 (ග) වගන්තිය ප්‍රකාරව මැණික් කර්මාන්තයේ හා ස්වර්ණාභරණ කර්මාන්තයේ වැඩ කරන තැනැත්තන්ගේ ජීවිත හා ශරීරාංග අනතුරුවලින් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ආරක්ෂක පියවර විධිමත් කිරීම හා පාලනය කිරීමේ අරමුණින් මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කිරීමේදී රු.500 බැගින් අයකර මැණික් ගැරීමේ සුභසාධක අරමුදලට බැර කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට මෙම අරමුදලේ ශේෂය රු.34,154,875 ක් වූ අතර මෙම | මෙම අරමුදල ඌන උපයෝජනය වීම වළක්වාගැනීම සඳහා 2020 වර්ෂය තුලදී පතල් අනතුරු සම්බන්ධයෙන් ලබාදී ඇති ප්‍රතිලාභ සැලකිය යුතු මට්ටමකින් ඉහල නැංවීමට කටයුතු කර ඇත. එසේම මෙම අරමුදල මගින් දරනු ලබන්නේ අනපේක්ෂිත අනතුරු සඳහා වන වන්දි මුදල් වන බැවින් ප්‍රමාණවත් අරමුදලක් පවත්වාගෙන යාම අවශ්‍යවන බව පෙන්වා දෙමි. | අපේක්ෂිත අරමුණු ඉටු වන අයුරින් අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

අරමුදල මගින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික සමාගමක් මගින් අධිකාරිය පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ල ආසන්නයේ සිදුකල ඉදිකිරිම් කටයුතු නිසා අධිකාරියේ ගොඩනැගිල්ලට හානි සිදුවී ඇති වු අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත සමාලෝචිත වර්ෂයේ එම ස්ථානයෙන් ඉවත් වී තිබුණි. මෙහිදී ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව 2021 සැප්තැම්බර් 03 දින සිට කෙටි කාලයක් සඳහා පෞද්ගලික ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබුණි. | 2021 ජුලි 16 අධිකාරියේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සිදුවූ ගිලාබැසීම මත ජාතික ගොඩනැගිලි පරියේෂණ ආයතනයේ නිර්දේශය මත එදින සිට අධිකාරී කටයුතු මත අත්‍යාවශ්‍ය රාජකාරි පමණක් නාරාහේන්පිට පිහිටි ජාතික මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශයේ සිදු කරන ලදී. එම පරිශ්‍රයේ ප්‍රමාණවත් ඉඩක් නොතිබීම මත පැවති කොවිඩ් 19 රෝගය හේතුවෙන් අධිකාරියේ නිළධාරින් කිහිපදෙනෙක් රෝගී තත්වයට පත්විය. කෙසේ නමුත් අධිකාරිය සඳහා මූලික වශයෙන් එකඟ වු පරිදි රේණුකා සමූහ ව්‍යාපාරය මගින් ගොඩනැගිල්ල ලබා දීම මගහැරීම මත තාවකාලික කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් සොයා ගැනීම අධිකාරියට සිදුවිය. ඒ සඳහා අධිකාරිය මගින් ස්ථාන 5 ක් පරික්ෂා කල අතර ඒ අතරින් අධිකාරිය සඳහා සුදුසුම ගොඩනැගිල්ල දැනට අධිකාරිය ස්ථාපිත කර ඇති අංක 12, මැක්සන්ස් ටවර්, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩන්, කොළඹ 3 පිහිටි ගොඩනැගිල්ල බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය අනුගමනය කළ යුතුය. |
| (ආ) | පසුව ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කර මිල ගණන් කැඳවා තිබු අතර දැනට ස්ථාපිත කර ඇති ගොඩනැගිල්ල සඳහා හා වෙනත් ගොඩනැගිල්ලක් සඳහා පිළිවෙලින් රු.4,500,000 ක් රු.3,000,000 ක් වශයෙන් මිල ගණන් ලැබී තිබුණු අතර වැඩිමිල ඉදිරිපත් කල අධිකාරිය දැනට ස්ථාපිත ගොඩනැගිල්ල තෝරා ගෙන ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව කුලියට ගත් කාලයද ආවරණය වන පරිදි 2021 අගෝස්තු 31 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා කාලපරිච්ඡේදයට බදු ගිවිසුමකට එළඹ තිබුණි. අඩුම ලංසුව ඉදිරිපත් කල ආයතනය තෝරා නොගැනිම | ගොඩනැගිල්ල බදු පදනම මත ලබා ගැනීම සඳහා රු. 3,800,000 බැගින් මාස 4 ක කාලයක් පමණක් මුදල් ලබාදිය හැකි බව අවසන් වශයෙන් රේණුකා සමූහ ව්‍යාපාරය විසින් අධිකාරිය වෙත දන්වන ලදී. කෙසේ නමුත් මාස 4 ක කාල සීමාවක් සඳහා කිසිම සමාගමක් හෝ අයිතිකරුවෙක් ගොඩනැගිල්ලක් ලබා නොදීම මත, මාස 3 ක් පෙර දැනුම් දීමකින් ඉවත් වීමට හැකි වන පරිදි වර්ෂ 2 ක කාල සීමාවක් සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී.<br>ඉන් අනතුරුව 2021 සැප්තැම්බර් 2 දින ගිවිසුම් අත්සන් කිරිමෙන් පසුව ප්‍රධාන කාර්යාලය නව ස්ථානයේ ස්ථාපිත කරන ලදී. ඊට සමගාමීව අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් වලට අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ අතර, ඒ සඳහා ආයතන 2 ක් මිල ගණන් ඉදිරිපත් කර ඇති අතර, එහි මිල ගණන් පිළිවෙළින් රු. 4,500,000 ක් හා 3,000,000 විය.<br>කෙසේ නමුත් අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයට අයත් ගොඩනැගිල්ලෙහි ඇති | විනිවිදභාවයකින් යුතුව ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිසා අධිකාරියට කුලියට ගත් වර්ෂ 2 සඳහා රු.36,000,000 ක් වැඩියෙන් ගෙවීය යුතුව පැවතුණි. | තාක්ෂණික අඩුපාඩු හා අධිකාරියේ අරමුණට නොගැලපීම හේතුවෙන් අධිකාරි සඳහා බදු පදනම මත ලබාගැනීමට සුදුසුම ගොඩනැගිල්ල අංක 12, මැස්සන්ස් ටවර්, ඇල්ෆඩ් හවුස් ගාඩන්, කොළඹ 03 පිහිටි ගොඩනැගිල්ල තාක්ෂණ ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව මගින් නිර්දේශ කරන ලදී. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර අනුමැතිය ලබාගෙන ගිවිසුම අවලංගු නොකර දැනට කාර්යාල කටයුතු පවත්වාගෙන යන බව කාරුණිකව දන්වමි.<br>මෙම නව ගොඩනැගිල්ල සඳහා වැඩිපුර ගෙවන ලද මුදල බිම් මහල සහ අතරමැදි මහල සමගින් අලෙවිසැල් සඳහා බදු පදනම මත ලබා දීමෙන් මෙම පිරිවැය අවම කිරීමට සැලසුම් කර ඇති අතර මේ වනවිට ප්‍රසම්පාදන කටයුතු ආරම්භකර ඇත. | |
| (ඇ) | මෙම ගොඩනැගිල්ලේ දුරකථන හා අභ්‍යන්තර දුරකථන සබඳතා, ජාලගත රැහැන් ඇදීම (Networking) බුමුතුරුණු ඇතිරීම, ව්‍යුහාත්මක වෙන් කිරීම (Partition) සඳහා 2022 අප්‍රේල් 25 විගණිත දින වන විට රු.14,967,592 ක් වැය කර තිබුණි. | පරිසනක ජාල ගත කිරීම, දුරකථන පද්ධතිය හා අභ්‍යන්තර දුරකථන පද්ධතිය සුථාපිත කිරීම, කාර්යාල උපාංග ප්‍රවාහනය කිරීම මැණික් රසායනාගාරය හා රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ රසායනාගාර වල සිදු කල යුතු මූලික පාටිශන් කිරීම් සිදු කිරීමකින් තොරව කාර්යාල කටයුතු ආරම්භ කිරිම සිදු කිරිම කළ නොහැකි බැවින් ඉහත කටයුතු සිදු කරන ලදී. එලෙස අධිකාරියේ ගොඩනැගිල්ල ගිලා බැසීම හේතුවෙන් දැරීමට සිදුවූ අයකර ගැනීම සඳහා රේනුකා සමාගමට විරුද්ධව සිවිල් නඩු කරයක් පැවරීමට කටයුතු කර ඇත. | අධිකාරියට දැරීමට සිදු වූ මුදල් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | අධිකාරිය නව ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීම සඳහා 2022 අප්‍රේල් 22 විගණිත දින වන විට රු.53,244,339 ක මුදලක් අධිකාරියට දැරීමට සිදුවූ අතර අධිකාරිය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලට හානි සිදුවන පරිදි ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද පුද්ගලික සමාගමෙන් එම මුදල් අයකර ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව "ගෝල්ෆේස් ප්‍රොපටීස්" ආයතනය හේතුවෙන් අධිකාරිය වෙත සිදුව ඇති සියලු හානි සහ පාඩු පූර්ණ කර ගැනීම සඳහා සිවිල් නඩුකරයක් පවරා පවත්වාගෙන යාමට උපදෙස් සහ අනුමැතිය හිමි වූ බැවින් එකී නඩුකරය පවත්වාගෙන යාමේදී අගතියක් සිදු නොකිරිමේ නෛතික අවශ්‍යතාවය මත "ගෝල්ෆේස් ප්‍රොපටීස්" ආයතනය සමඟ වන්දි අය කර ගැනීම සඳහා වූ ගිවිසුම්වලට එළඹීමක් සිදු කර නොමැත.<br>අධිකාරිය බදු පදනම මත නව ස්ථානයක ස්ථාපිත කිරිමේ දි මෙතෙක් අධිකාරිය විසින් සිදු කරන ලද සියලු වියදම් නීති මාර්ගයෙන් අයකර ගැනීම සඳහා එම වියදම් නීති අංශය වෙත යොමු කර ඇත. | -එම- |